චක්‍රලේඛ අංක. 2003/20


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 784807, 784832

ලේකම් / செயலாளர் / Secretary: 784811

කාර්යාලය / அலுவலகம் / Office: 785141-50, Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : secedu@sltnet.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

மனிதவள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு

Ministry of Human Resources Development, Education & Cultural Affairs

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල.

'இசுருபாய', ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல.

"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. : ....................

මගේ අංකය / எனது இல. / My No. : ඊඩ්/01/12/01/02/01

දිනය / திகதி / Date : 2003. 05. 12

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාසභාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පාසල්වල විදුහල්පතිවරුන්
සියලුම පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන් වෙත

## විෂය සමගාමී හා විෂය බාහිර විවිධ ක්‍රියාකාරකම් යටතේ (ක්‍රීඩා, නැටුම්, සංගීත, චිත්‍ර හා වෙනත්) ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගුරුභවතුන් හා නිලධාරීන් විදේශගතවීම

❖ ඉහත කරුණුවලට අදාලව හෝ ඉන් පරිබාහිරව හෝ මින් ඉදිරියට පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුභවතුන්, විදුහල්පතිවරුන් හා අනිකුත් සියලුම නිලධාරීන් විදේශගතවන සෑම අවස්ථාවකම ඒ පිළිබඳ සියලුම විස්තර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට, එසේ සහභාගීවීම සඳහා අමාත්‍යාංශයේ අවසරය අනිවාර්යයෙන්ම ලබාගත යුතුය.

මේ සඳහා අදාළ විදුහල්පතිවරුන් විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි පහතින් සඳහන් වේ.

### (01). පාසල් සංගම් විසින් සපුරාලිය යුතු කරුණු

❖ පාසල් සංගම් විදේශීය තරගවලට සහභාගීවන අවස්ථාවලදීද එසේ සහභාගී වීමට ලත් ආරාධනාව සහ ක්‍රීඩකයන් තේරීම් පටිපාටිය සහ ඒ සඳහා සහභාගීවන ගුරු මහත්ම / මහත්මීන් තෝරා ගන්නා පදනම හා ඒ සඳහා මුදල් ලබාගන්නා ආකාරය පැහැදිලිව විස්තර කොට අවසර ලබා ගත යුතුයි.

### (02) ජාතික සංගම් මගින් සපුරාලිය යුතු කරුණු :

❖ ජාතික සංගම් පාසල් ළමුන් විදේශ තරග සඳහා සහභාගී කරවන අවස්ථා වලදී එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට වැය වන සියළුම වියදම් ජාතික සංගමය විසින් දැරිය යුතුය.

❖ තෝරා ගැනීමේ පටිපාටිය හා ආරාධනා පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුයි. මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ නිළධාරියෙකු හෝ අදාළ ක්‍රීඩාවට සම්බන්ධ ගුරුභවතෙකු වන පුහුණුකරුවෙකු හෝ මෙම චාරිකාව සඳහා සහභාගී කරවා ගත යුතුය. එසේ නොවන අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ඒ කරුණ සඳහා වෙනම ලබාපත යුතුය. ඔවුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වාර්තාවක් සැපයිය යුතුයි. අදාල ලියකියවිලි ඉදිරිපත් කොට අවසරය ලබා ගත යුතුයි.

### (03) පාසල් කණ්ඩායම්

❖ පාසල් කණ්ඩායම් විදේශ චාරිකා සඳහා සහභාගි වීමට නම් පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුයි. මෙසේ සහභාගී වන පාසල් කණ්ඩායම් ජාතික මට්ටමේ තරගයේදී එම වසරේ හෝ ඊට පෙර වසරේ එම වයස් කාණ්ඩයෙන් 1,2,3 ස්ථාන ලබාගෙන තිබිය යුතුයි. එසේ නොමැති නම් එම පාසල් සංගමය විසින් සංවිධානය කරනු ලබන ජාතික තරගයේදී එම වයස් කණ්ඩායන් ශූරතාවය , අනුශූරතාවය හෝ තෙවෙනි ස්ථානය ලබාගෙන තිබිය යුතුයි. මෙසේ නොවන අවස්ථාවලදී අදාළ කණ්ඩායම / කණ්ඩායම් සහභාගී කරවීමට හේතු පාදක වන විශේෂ හේතු අදාළ විදුහල් ප්‍රධානියාගේ නිර්දේශය හා පාසල් සංවර්ධන සමිතියේ කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය ද සහිතව (අදාළ නිර්දේශ ලබාගත් කාරක සභා සම්ති

වාර්තා පිටපතක් ද ඇමිණිය යුතුය.) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය ද සමග ඉදිරිපත් කළ යුතුය.

එම චාරිකාව සඳහා මුදල් සොයා ගන්නා ආකාරයත් , සහභාගිවන ගුරුවරුන් හා උපදේශකයින්ගේ විස්තරත් විදේශයෙන් ලැබෙන ආරාධනා පත්‍රයේ මුල් පිටපත් ද මේ සමග ඉදිරිපත් කළ යුතුය.

## (04) ගුරු මහත්ම / මහත්මීන් විදේශ පුහුණු වැඩමුළු සඳහා සහභාග කිරීම

### විදේශ පුහුණු වැඩසටහන් සඳහා ගුරු මහත්ම/ මහත්මීන් සහභාගී කරවීමේ දී

- එම ගුරු මහත්ම / මහත්මීන් තෝරා ගනු ලබන පදනම
- මෙම පුහුණු පාඨමාලාවට හෝ තරගය සඳහා යන වියදම් දරණ ආකාරය පැහැදිලි කළ යුතුයි.
- ගුරු මහත්ම / මහත්මිය විදේශගත වී සිටින කාල සීමාව තුළ පාසලේ තමන්ගේ කාර්යය කිරීමට යොදා ඇති වැඩ පිළිවෙල
- මෙම පාඨමාලාවට හෝ තරගයට සහභාගීවීමෙන් ලැබෙන ප්‍රයෝජන හෝ ප්‍රතිලාභ පැහැදිලිව ඉදිරිපත් කරන්න.
- සහභාගිවන ගුරු මහත්ම /මහත්මීන්ගේ වියදම් සම්බන්ධ බර අදාළ තරගවලට සහභාගිවන ළමුන් හෝ ඔවුන්ගේ දෙමාපියන් වෙත නොපැවරිය යුතුය.

## (05) වෙනත් සංවිධානයක් විසින් කෙරෙන ආරාධනා මත පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තරග සඳහා විදේශගතවීම.

- මෙම විදේශ ගමන සඳහා සියළුම වියදම් අදාල සංගමය විසින් දැරිය යුතුය.
- මෙම විදේශ පුහුණු පාඨමාලාව, තරගය හෝ වැඩමුළුව සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා ගනු ලබන ආකාරය
- එසේ සහභාගිවන කණ්ඩායම සමග (ගුරු මහත්මයෙකු/ගුරු මහත්මියකු, හෝ අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ නිලධාරියෙකු හෝ සහභාගී කරවිය යුතුය. ඔහු විසින් වාර්තාවක් ගමන අවසානයේදී දිවයිනට පැමිණ වහාම සැපයිය යුතුයි.
- අදාල විෂය ක්ෂේත්‍රයට අයත් පාසල් සංගමයෙන් මෙම ගමන සංවිධානය කරනු ලබන සංගමය පිළිබඳ රජය අනුමත කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.

(06) මෙයට පරිබාහිරව පාසල් ප්‍රධානීන් විසින්, තම පාසලේ සිසු දරුවන් මොනම හේතුවක් නිසාවත්, මෙම අමාත්‍යාංශයේ පූර්ව අවසරයක් නොමැතිව විදේශ සංචාර සඳහා යොදා ගැනීම සපුරා තහනම් බව තදින්ම අවධාරණය කරමි. දැනටමත් මෙම නීතිරීති කඩ කර ඇති විදුහල් ප්‍රධානීන්ට විරුද්ධව විනයානුකූල පියවර ගනු ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි.

(අත්සන)

වී.කේ. නානායක්කාර
ලේකම්
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු ලේකම් වෙනුවට